# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/16 - 2022 ජනවාරි මස 11 වැනි අඟහරුවාදා - 2022.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2022 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2022 අංක 01 දරන ආනයන හා අපනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසි"** යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2022 ජනවාරි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

3. ආනයන සහ අපනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසි - 2017 ප්‍රකාශයට පත් කරන ලද 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ***I*** උපලේඛනයෙන් පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් ඉවත් කරනු ලැබේ.

1A - PG 5708 - 460 (2022/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| *අනුක්‍රමික අංකය* | *II තීරය සංයෝජිත වර්ගීකරණ කේතය* | *III තීරය භාණ්ඩ විස්තරය* | *VI තීරය ප්‍රමිතිය* |
|---|---|---|---|
| 21 | 1701.14.00 | දුඹුරු සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 883 දුඹුරු සීනි සඳහා පිරිවිතර |
| 22 | 1701.99.10<br>1701.99.20<br>1701.99.90 | සුදු සීනි සහ අයිසින් සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 191 සුදු සීනි සඳහා පිරිවිතර |

4. ආනයන සහ අපනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසි - 2017 ප්‍රකාශයට පත් කරන ලද 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනයට පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් ඇතුළත් කරනු ලැබේ.

5. මෙම *ගැසට් පත්‍රයේ* I උපලේඛනයේ අනුක්‍රමික අංක 128 යටතේ වූ කිසියම් භාණ්ඩයක් සඳහා ප්‍රමිති අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමට රසායනාගාර පහසුකම් නොමැති අවස්ථාවක දී, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතනය කරන ලද එවැනි රසායනාගාර පහසුකම් ස්ථාපිත කරන තුරු, එම කටයුතු සිදුකරනු ලබන්නේ 2018 මාර්තු මස 29 දිනැති 2064/34 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 4 දරන රෙගුලාසිවලට අනුව පමණි.

6. ඉහත රෙගුලාසි 5 උල්ලංඝනය කරමින් අනුක්‍රමික අංක 128 යටතේ සඳහන් කර ඇති කිසියම් භාණ්ඩයක් ආනයනකරුවෙකු විසින් ආනයනය කරන්නේ නම්, රේගු නිෂ්කාශනය සඳහා අවසර නොදෙන අතර අවසරය ප්‍රතික්ෂේප කළ දින සිට දින තිහක් (30) ඇතුළත එම භාණ්ඩ ප්‍රතිඅපනයනය කළ යුතුය.

**I උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *II තීරය සංයෝජිත වර්ගීකරණ කේතය* | *III තීරය භාණ්ඩ විස්තරය* | *VI තීරය ප්‍රමිතිය* |
|---|---|---|---|
| 123 | 1701.12.10<br>1701.12.90<br>1701.13.00<br>1701.14.10<br>1701.14.90<br>1701.91.30<br>1701.91.90 | දුඹුරු සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 883 දුඹුරු සීනි සඳහා පිරිවිතර |
| 124 | 1701.91.10<br>1701.91.20<br>1701.99.10<br>1701.99.20<br>1701.99.30<br>1701.99.40 | සුදු සීනි සහ අයිසින් සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 191 සුදු සීනි සඳහා පිරිවිතර |
| 125 | 1701.99.90 | වෙනත් | ශ්‍රී ලංකා ප්‍රමිති 883 දුඹුරු සීනි සඳහා පිරිවිතර<br>ශ්‍රී ලංකා ප්‍රමිති 191 සුදු සීනි සඳහා පිරිවිතර |
| 126 | 2711.19.10 | ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව | ශ්‍රී ලංකා ප්‍රමිති 712 ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා පිරිවිතර |

| *අනුක්‍රමික අංකය* | *II තීරය සංයෝජිත වර්ගීකරණ කේතය* | *III තීරය භාණ්ඩ විස්තරය* | *VI තීරය ප්‍රමිතිය* |
|---|---|---|---|
| **127** | 3917.31.10<br>3917.39.10<br>4009.21.10<br>4009.22.10<br>4009.31.10<br>4009.32.10<br>4009.41.10<br>4009.42.10<br>8307.10.10<br>8307.90.10 | ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා සොඬනල සහ සොඬනල එකලාසයන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1172 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා සොඬනල සහ සොඬනල එකලාසයන් සඳහා පිරිවිතර |
| **128** | 8481.10.10 | ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු සිලින්ඩර සමග භාවිතයට ගන්නා කපාට සවිකුරු | ශ්‍රී ලංකා ප්‍රමිති 1184 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු සිලින්ඩර සමග භාවිතයට ගන්නා කපාට සවිකුරු සඳහා පිරිවිතර |
| **129** | 8481.10.20 | ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා යාමකයන් සහ ස්වයංක්‍රීය මාරු උපක්‍රමිකයන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1180 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා යාමකයන් සහ ස්වයංක්‍රීය මාරු උපක්‍රමිකයන් සඳහා වන පිරිවිතර |

EOG 01 - 0145

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.